# සුවෙන් පෙරට
# e ඉගෙනුම් පියස
# මිනුවන්ගොඩ

- ශ්‍රේණිය - 10
- විෂයය - ඉතිහාසය
- පාඩම - 10- ශ්‍රී ලංකාව හා බටහිර ලෝකය ( 2 කොටස )


- සැකසුම - තමාලි පෙරේරා
  නියෝජ්‍ය විදුහල්පති
  මිනු/ බලබෝව කණිෂ්ඨ විද්‍යාලය

# ශ්‍රී ලංකාව හා බටහිර ලෝකය
# 2 කොටස




## ➢ සීතාවක රාජධානිය

- සීතාවක පළමු පාලකයා වූ මායාදුන්නේ මුල සිටම පෘතුගීසි විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කළේය
- ඔහු පුත් ටිකිරි කුමරු හා පෘතුගීසින් අතර මුල්ලේරියාවේදී දරුණු සටනක් ඇතිවිය
- එහිදී පෘතුගීසින් අන්ත පරාජයට පත්විය



## ➢ මුල්ලේරියා සටන

- මෙම සටන මෙහෙයවන ලද්දේ මායාදුන්නේ රජුගේ පුත් ටිකිරි කුමාරයාය
- පුරා දිනයක් තිස්සේ පැවති මෙම සටනින් පෘතුගීසීන් අන්ත පරාජයට පත්වූහ
- එහිදී පෘතුගීසි පක්ෂයෙන් මිය ගිය සංඛ්‍යාව 1600ක් පමණ වෙතැයි වාර්තා වේ
- මෙය ආසියානු රටකදී පෘතුගීසීන් ලැබූ දරුණුතම පරාජයකි




- මායාදුන්නේගේ මියයාමෙන් පසුව ටිකිරි කුමරු පළමුවන රාජසිංහ නමින් සීතාවක රජ විය
- ඉන්පසුව එතුමා කරලියද්දේ බණ්ඩාර පන්නා දමා උඩරට රාජ්‍යයද අල්ලා ගත්තේය
- පළමුවන රාජසිංහ රජතුමා පෘතුගීසින් කොළඹ කොටුවට පන්නා දමා ඔවුන් මෙරටින් පලවා හැරීමට උත්සාහ කළද එය අසාර්ථක විය

## ➢ ඊට බලපෑ හේතු

- පෘතුගීසීන්ගේ පෙරදිග මධ්‍යස්ථානය වූ ගෝවෙන් ඔවුන්ට ආධාර ලැබීම
- සීතාවක රාජධානියට නාවික ශක්තියක් නොතිබීම



- සීතාවක රාජසිංහ රජු උඩරට පළමුවන විමලධර්මසූරිය රජු සමඟ කළ සටනින් පරාජය විය
- ආපසු යන අතරතුර පෙතන්ගොඩ උයනේදී උණ කටුවක් ඇනීමෙන් රෝගාතුර වූ රජතුමා මිය ගියේය



## ➢ සීතාවක පරිහානියට බලපෑ හේතු

- සීතාවක පාලකයන් නිරන්තර යුද්ධයක නියැළීම
- පළමුවන රාජසිංහ රජු අවසාන කාලයේ දී අනුගමනය කළ බෞද්ධ විරෝධී ප්‍රතිපත්ති
- උඩරට ප්‍රභූවරයෙකු වීරසුන්දර බණ්ඩාර මැරවීම නිසා උඩරැටියන්ගේ සහාය නොලැබීම
- කොනප්පු බණ්ඩාර උඩරට රජ වීම
- පළමුවන රාජසිංහ රජුගෙන් පසු සීතාවක රාජ්‍යයට උරුමකරුවන් නොසිටීම



## ➢ පෘතුගීසින් හා යාපනය රාජ්‍යය



- පෘතුගීසින් පැමිණෙන විට යාපනය රාජධානියේ පාලකයා වූයේ ආර්යචක්‍රවර්තී පෙළපතට අයත් පරරාජසේකරම් නැමැත්තෙකි
- යාපනයේ වෙළෙඳ ද්‍රව්‍ය නොතිබූ බැවින් පෘතුගීසීන් මුල් කාලයේ යාපනය පිළිබඳව සැලකිල්ලක් නොදැක්වූහ
- පරරාජසේකරම්ට පසුව සංකිලි නැමැත්තෙක් යාපනයේ රජ විය
- සංකිලි රජු හා පෘතුගීසින් අතර ගැටුම් ඇති විය

## ➢ ඊට බලපෑ හේතු

- මෙකල පෘතුගීසීන්ගේ වෙළඳ නැව් වලට බාධා එල්ල වීම
- යාපනයට අයත් ප්‍රදේශවල කතෝලික ආගම පැතිරවීමට එරෙහිව සංකිලි රජු කටයුතු කිරීම


- සංකිලිට පසුව **පුවිරාජ පණ්ඩාරම් ,එදිරිමාන්නසිංහම් ,දෙවන සංකිලි** යන රජවරු යාපනය පාලනය කළහ

- **යාපනයේ පාලකයන් ඇතැම් අවස්ථාවල උඩරට රජුගේ වෙළඳ කටයුතුවලට සහාය දීමත් , දකුණු ඉන්දියාව සමග සම්බන්ධතා පැවැත්වීමත්** පෘතුගීසීන් කිසිවිටෙකත් නොඉවසූහ

- එනිසා 1619 දී **පිලිප් ද ඔලිවේරා** යටතේ යැවූ පෘතුගීසි හමුදාවක් විසින් යාපනය යටත් කර ගන්නා ලදී

- පසුව ඇතිවූ කැරලි මර්දනය කොට පෘතුගීසීන් යාපනයේ බලය පිහිටවූයේ 1621දීය.

## ➢ යාපනය රාජධානිය බිඳ වැටීමට හේතු



- යාපනයේ රජ උරුමකරුවන් අතර ඇති වූ බල අරගල

- යාපනයේ පාලකයින්ට නිත්‍ය හෝ ප්‍රමාණවත් හමුදාවක් නොසිටීම


- යාපනයට උඩරටට මෙන් ස්වභාවික ආරක්ෂාවක් නොතිබීම

# ❑ උඩරට රාජධානිය තුළ පෘතුගීසි බලය පැතිරවීමේ ප්‍රයත්න

| වර්ෂය | ස්ථානය | සටන මෙහෙය වූ පෘතුගීසි සෙනෙවියා | සටන ජයගත් උඩරට රජතුමා |
| --- | --- | --- | --- |
| **1594** | දන්තුරේ | පේරෝ ලෝපේස් ද සූසා | පළමුවන විමලධර්මසූරිය රජතුමා |
| **1602** | බලන | දොන් ජෙරනිමෝද අසවේදු | පළමුවන විමලධර්මසූරිය රජතුමා |
| **1630** | රන්දෙණිවෙල | කොන්ස්තන්තීනු ද සා | මහ අස්ථාන කුමාරයා |
| **1638** | ගන්නෝරුව | දියෝගුද මේලෝ කස්ත්‍රෝ | දෙවන රාජසිංහ රජතුමා |

## ➢ පෘතුගීසින්ගේ උඩරට ආක්‍රමණ අසාර්ථක වීමට හේතු

- උඩරට ජනතාව හැමවිටම රජුට සහාය දීම
- පෘතුගීසීන් වෙනුවෙන් සටන් කිරීමට ගිය පහතරැටියන් උඩරටදී රජුට එකතුවීම
- උඩරැටියන්ගේ සටන් උපක්‍රම හා රජවරුන්ගේ උපාය කෞශල්‍යය
- උඩරට රාජධානියේ ස්වභාවික පිහිටීම



# ශ්‍රී ලංකාව හා ලන්දේසීන්



- ලන්දේසීන්ගේ මව් රට ඕලන්දයයි
- ඔවුන් 1602 දී පෙරදිග ඕලන්ද වෙළඳ සමාගම (VOC) පිහිටුවාගෙන පෙරදිගට පැමිණියහ
- ලන්දේසින් පෙරදිගට පැමිණීමේ ප්‍රධාන අරමුණ ආර්ථික වාසි ලබා ගැනීමයි
- ජාවා දූපතේ බතාවිය ඔවුන්ගේ පෙරදිග මූලස්ථානය විය






- ලන්දේසීන් ආසියාවට පැමිණ වැඩිකල් යාමට පෙර ඉතා හොඳ වර්ගයේ ගම්මිරිස් හා කුරුඳු වැනි වෙළෙඳ ද්‍රව්‍ය සහිත ලංකාව කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු විය



## ➢ ලංකාවට පැමිණි ලන්දේසි දූතයින්

❖ **1602 -** ජොරිස් වැන් ස්පිල්බර්ජන් - පළමුවන විමලධර්මසූරිය රජු
සිබල් ද වර්ට්



- මෙම දූත ගමන්වලින් සාර්ථක ප්‍රතිඵල නොලැබුණි

- දෙවන රාජසිංහ රජු හා ලන්දේසීන් අතර සිදුවූ ලිපි හුවමාරුවේ හා දූත ගමන්වල ප්‍රතිඵල වශයෙන් පෘතුගීසින් මෙරටින් නෙරපීම සඳහා රජුට සහාය දීමට ලන්දේසීන් කැමති වූහ

- 1638 - වෙස්ටර්වල්ඩ් - දෙවන රාජසිංහ රජු

## 1638 උඩරට ලන්දේසි ගිවිසුම

- පෘතුගීසින් මෙරටින් පලවා හැරීමට උඩරට රජුට සහය දීමට ලන්දේසින් එකඟවීම
- ලන්දේසීන්ට වැයවන මුදල්,වෙළඳ ද්‍රව්‍ය ( කුරුඳු ,ගම්මිරිස් ,මී ඉටි ) මගින් ගෙවීමට රජු එකඟ වීම
- ඇතුන් හැර උඩරට සෙසු වෙළෙඳ ද්‍රව්‍ය ලබාගැනීම පිළිබඳ ඒකාධිකාරී අයිතිය ලන්දේසීන්ට ලැබීම
- පෘතුගීසින්ගෙන් අල්ලා ගන්නා ලද බලකොටුවල රජු අදහස් කරන්නේ නම් ලන්දේසි හමුදාව නතර කරවීමට එකඟවීම

- **1638** සිට **1658** දක්වා වසර **20** ක කාලය තුළ පෘතුගීසි බලකොටු සියල්ල අල්ලා ගැනීමට ලන්දේසීන් සමත් වූහ



- ත්‍රිකුණාමලය
- මීගමුව
- ගාල්ල
- කළුතර
- කොළඹ
- මන්නාරම
- යාපනය

- නමුත් එම බලකොටු ආපසු රජුට භාර නොදුන් අතර පෘතුගීසින් වෙනුවට ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසින් පදිංචි වූහ


ඉඟුරු දිලා මිරිස් ගත්ත
දෙවන රාජසිංහ රජු

# ➢ උඩරට සම්බන්ධයෙන් ලන්දේසි ප්‍රතිපත්තිය



- ➢ උඩරට සමඟ සාමකාමීව කටයුතු කිරීමට උත්සාහ දැරීම
- ➢ උඩරට රජුගේ හොඳ හිත දිනා දිනා ගැනීමට උත්සාහ කිරීම
  - ▪ රජුට තෑගි බෝග ලබාදීම
  - ▪ රජු හමුවීමට දූතයන් යැවීම
  - ▪ රජු සමග ලිපි හුවමාරු කර ගැනීම
- ➢ රජුගේ ආගමික කටයුතුවලට අවශ්‍ය නැව් සපයාදීම
  - ▪ උපසම්පදා භික්ෂූන් රැගෙන ඒම සඳහා

දෙවන විමලධර්මසූරිය රජුට ශ්‍රී විජය රාජසිංහ රජුට හා කීර්ති ශ්‍රී රාජසිංහ රජුට නැව් ලබාදීම

## ➢ උපරිම ආර්ථික වාසි ලබා ගැනීමේ ලන්දේසි ප්‍රතිපත්ති

- උඩරට රජු වෙනත් විදේශිකයන් සමඟ වෙළඳ සබඳතා පැවැත්වීම අවහිර කිරීම
- රජු සමග මත ගැටුම් ඇති වූ විට උඩරට හා පහතරට අතර කඩවත් වසා දැමීම
- පහතරට ඇතැම් ප්‍රදේශවල වී වගාව දියුණු කිරීම
  (මෙමගින් සහල් ආනයනයට යන වියදම අවම කර ගැනීමට ලන්දේසීහු අපේක්ෂා කළහ )
- කුරුඳු වගා කරවීම හා කුරුඳු වගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීම
- ලාභ ලැබිය හැකි උක්, කපු ,කෝපි ආදිය වගා කරවීමට ක්‍රියා කිරීම

## ➢ උඩරට රාජ්‍යය හා ලන්දේසින් අතර ගැටුම් ඇතිවීම

- **1764** දී ලන්දේසීහු බැරන් වැන් එක් ආණ්ඩුකාරවරයාගේ මෙහෙයවීම මත උඩරට ආක්‍රමණය කළහ
  - නමුත් එම ආක්‍රමණය අසාර්ථක විය

- 1765 දී නැවත වරක් ලන්දේසීහු උඩරට ආක්‍රමණය කළහ

- 1766 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ලන්දේසීන් සමඟ සාම ගිවිසුමක් අත්සන් කළේය

❑ එම ගිවිසුම නිසා ,

- ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ ලන්දේසීන්ට හිමි විය
- වරායන් හා ලුණු ලේවායන් ආශ්‍රිත ප්‍රදේශය ලන්දේසින්ට හිමිවිය

➢ ගිවිසුමේ කොන්දේසි ලිහිල් කිරීමට ලන්දේසීන් එකඟ නොවූහ

➢ එනිසා එය ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක නොවන තැනට පත් කිරීමට උඩරැටියෝ කටයුතු කළහ

ස්තූතියි!

තමාලි පෙරේරා